ඌව පළාත් සභාව - 2018
----------------------------

1. මූල්‍ය ප්‍රකාශන
---------------

1.1 තත්ත්වාගණනය කළ මතය
------------------------------

ඌව පළාත් සභාවේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 23(1) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පළාත් සභා පනතේ 23(2) වගන්තිය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 29 දින නිකුත් කරන ලද අතර ජාතික විගණන පනතේ 11(2) උපවගන්තිය ප්‍රකාර විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 30 දින නිකුත් කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව හා ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
--------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදී. මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්න්ධයෙන් කළමනාකරණයේ වගකීම
------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

පළාත් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම පළාත් භාණ්ඩාගාරය ඇතුළු ඒ ඒ ආයතනවල කළමනාකාරීත්වය විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව ඌව පළාත් සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය අදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම
-------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත් ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් තොර බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලකිලිමත් විය යුතුය.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතු වේ.

- අවස්ථාවෝචිත උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස පළාත් සභාවේ අභ්‍යන්තර පාලනය සැලකිල්ලට ගන්නා නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුලදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව කළමනාකරණය දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව
---------------------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
---------------------------------------

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු
-----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඌව පළාත් පුස්තකාල සේවා මණ්ඩලයට අයත් පුස්තකාල පොත්වල වටිනාකම හඳුනාගෙන 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2018 දෙසැම්බර් 31 දින වූ පුස්තකාල පොත්වල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. | ඉදිරියේදී පුස්තකාල පොත්වල වටිනාකම ගිණුම්ගත කිරීමට අපේක්ෂා කෙරේ. |
| (ආ) | ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික සහ ජේෂකර්ම අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම අනුව සමාලෝචිත වර්ෂය තුල පොදු තැන්පත් ගිණුමට බැර කිරීම් රු. 16,651,685 ක් වූ නමුත් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු. 18,150,786 ක් වුයෙන් රු. 1,499,101 ක වෙනසක් ද, විසර්ජන ගිණුම අනුව හර කිරීම් රු. 18,150,786 ක් වූ නමුත් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව එය රු. 16,651,685 ක් වූයෙන් රු. 1,499,101 ක වෙනසක් ද පැවතුණි. | ආයතනවලින් ඉදිරිපත් කරන ගිණුම් තොරතුරු, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලින් අනාවරණය කරන තොරතුරු සමඟ එකඟ විය යුතුවේ. | අදාල ආයතනයේ ගිණුම තුළ හර සහ බැර සටහන් මාරුකර දැක්වීමෙන් වෙනස සිදුවී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍යාංශයක හා දෙපාර්තමේන්තුවක විසර්ජන ගිණුම අනුව අග්‍රිම ගිණුමට හර කිරීම් එකතුව රු. 5,279,371,144 ක් වූ නමුත් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව එම හර කිරීම් රු. 128,735,964 ක් වූයෙන් රු. 5,150,635,180 ක වෙනසක් පැවතුණි. | දෙපාර්තමේන්තු විසින් පිළියෙල කරන ගිණුම් තොරතුරු ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමඟ එකඟ විය යුතුවේ. | අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම සකස් කිරීමේදී හර සහ බැර සටහන් කිරීමේ දෝෂයකින් වෙනස සිදු වී ඇත. |
| (ඈ) | සමාලෝචිත වර්ෂය තුළ අමාත්‍යාංශයක හා දෙපාර්තමේන්තුවක විසර්ජන ගිණුම් අනුව අග්‍රිම ගිණුමට බැර කිරීම් එකතුව රු. 5,288,469,527 ක් වූ නමුත් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව එම බැර කිරීම් රු. 18,208,961 ක් වූයෙන් රු. 5,270,260,566 ක වෙනසක් පැවතුණි. | දෙපාර්තමේන්තු විසින් පිළියෙල කරන ගිණුම් තොරතුරු ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමඟ එකඟ විය යුතුවේ. | අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම සකස් කිරීමේදී හර සහ බැර සටහන් කිරීමේ දෝෂයකින් වෙනස සිදු වී ඇත. |
| (ඉ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එක් අමාත්‍යාංශයක හා එක් දෙපාර්තමේන්තුවක විසර්ජන ගිණුම අනුව අග්‍රිම ශේෂ සමඟ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව අග්‍රිම ශේෂ සැසඳීමේදී රු. 122,550,866 ක වෙනසක් පැවතුණි. | දෙපාර්තමේන්තු විසින් පිළියෙල කරන ගිණුම් තොරතුරු ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සමඟ එකඟ විය යුතුවේ. | විසර්ජන ගිණුම සකස් කිරීමේදී දත්ත සටහන් කිරීමේ දෝෂයකි. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභාවේ ආයතන 03 ක් විසින් සකස් කරන ලද වාණිජ අත්තිකාරම් ගිණුම්වල ගෙවිය යුතු අත්තිකාරම් ශේෂ දක්වා නොතිබීම නිසා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අනුව පියවිය යුතු අත්තිකාරම් ශේෂය රු. 4,777,252 ක් විය. | ආයතනයේ තොරතුරු හා ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වලින් අනාවරණය කරන තොරතුරු එකඟ විය යුතුවේ. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කෙරේ. |
| (උ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් සභා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක්ද, ඇතුළුව පළාත් සභාවේ ආයතන 08 කට අදාලව පැවැති නොපියවූ අග්‍රිම ශේෂ එකතුව රු. 153,661,846 ක් විය. | වර්ෂය අවසානයේදී අග්‍රිම ශේෂ පියවීමට කටයුතු කල යුතුවේ. | මූල්‍ය ප්‍රකාශනවල සඳහන් තොරතුරු නිවැරදිය. |
| (ඌ) | වර්ෂ 10 කට අධික කාලයක් පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශනවල වත්කම් වශයෙන් දක්වා තිබුණු රු. 40,326,651 ක ණය මුදල සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ද අයකර නොතිබුණි. | අයවිය යුතු ණය ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම තොරතුරු නිවැරදිය. |
| (එ) | ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය කර මිලදී ගෙන බදුල්ල සහකාර කෘෂි අධ්‍යක්ෂ කාර්යාලය මගින් ගොවීන්ට නිකුත් කර තිබුණු රු.4,703,540 ක් වටිනා විවිධ වර්ගයේ විෂයයන් 19 කට අයත් ද්‍රව්‍ය හා උපකරණ ගොවීන් විසින් භාරගත් බවට විධිමත් සාක්ෂි ඉදිරිපත් නොකෙරිණි. | ද්‍රව්‍ය බෙදාදෙන අවස්ථා වලදී එම ද්‍රව්‍ය භාර ගත්බව තහවුරු කර ගැනීම. | උපකරණ හා ද්‍රව්‍ය ගොවීන් වෙත බෙදාදීමට අදාල බෙදා හැරීමේ ලැයිස්තු ඉදිරිපත් කර ඇත. |

1.6.2 අනුකූල නොවීම්
------------------

නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ
තීරණවලට අනුකූල නොවීම්

---------------------------------------------

පහත දැක්වෙන අනුකූල නොවීමේ අවස්ථා විගණනයේදී නිරීක්ෂණය විය.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛය | උපමාන පාදක සංවර්ධන ව්‍යාපෘති යටතේ සමාජ යටිතල පහසුකම් සඳහා වැයකළ හැකි වියදම් සීමාව ඉක්මවා රු. 3,283,428 ක් හෙවත් මුළු වියදමෙන් සියයට 53.7 ක්ද, ස්වයංරැකියා ප්‍රවර්ධනය හා ආගමික සංස්කෘතික කලා කටයුතු සඳහා අනුමත වියදමෙන් සියයට 10 කට වඩා අඩු ප්‍රමාණයක්ද වැයකර තිබුණු අතර වාරිමාර්ග සහ කෘෂිකාර්මික කටයුතු සඳහා කිසිදු මුදලක් වැයකර නොතිබුණි. | අදාල චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | මන්ත්‍රීවරු විසින් යෝජනා ලබාදීමේදී සමාජ යටිතල පහසුකම් නිර්නායකයට වැඩි යෝජනා ප්‍රමාණයක් ලබාදීම. |
| (ආ) | 1996 අගෝස්තු 01 දිනැති අංක 96/05 දරන ඉඩම් කොමසාරිස් චක්‍රලේඛය | වැල්ලවාය සහ ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ඉඩම් බදු ඒකකයක් ස්ථාපනය කර නොතිබුණි. | අදාල චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ප්‍රමාණවත් ඉඩකඩක් නොමැති බැවින් බදු ඒකකය ස්ථාපනය නොකළ අතර ඉදිරියේදී නිශ්චිත ස්ථානයක් වෙන්කර ගැනීමට කටයුතු කෙරේ. |
| (ඇ) | 2017 මැයි 29 දිනැති අංක 2017/02 දරන ඌව පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අභ්‍යන්තර චක්‍රලේඛය | පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමේදී කිසිදු අවස්ථාවක තමන්ගේ පෞද්ගලික මුදලින් ආහාර සඳහා ගෙවීම් සිදුකර පසුව ප්‍රතිපූර්ණය සඳහා ඉදිරිපත් නොකළ යුතු අතර අදාල සැපයුම්කරුට පමණක් ගෙවීම් සිදුකළ යුතුය. එහෙත් මොනරාගල | සැපයුම්කාර ආයතනයේ නමින් චෙක්පත් නිකුත් කළ යුතුවේ. | පුහුණු වැඩසටහන් පැවැත්වීමේදී වැඩසටහනට අදාල ප්‍රතිපාදන බොහෝවිට ලැබෙනුයේ වැඩසටහන පැවැත්වීමෙන් පසුවය. එම නිසා සියළු වියදම් විෂයභාර සහකාර අධ්‍යාපන අධ්‍යක්ෂ විසින් පෞද්ගලික මුදලින් දරා පසුව ඔහුගේ පෞද්ගලික නමට චෙක්පතක් නිකුත් කර වියදම් පියවාගෙන ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| | | කලාප අධ්‍යාපන කාර්යාලය විසින් පවත්වන ලද 2017 වර්ෂය තුළ ක්‍රීඩා තරඟ හා පුහුණු කඳවුරු 03 ක් වෙනුවෙන් රු. 216,300 ක ආහාර වියදම් පියවීමට අදාල චෙක්පත් සහකාර අධ්‍යක්ෂ (ක්‍රීඩා) ගේ පෞද්ගලික නමින් නිකුත්කර තිබුණි. | | |
| (ඇ) | 1996 අංක 01 දරන ඌව පළාත් ව්‍යාපාර නාම ප්‍රඥප්තිය | ලියාපදිංචි කළයුතු පුද්ගලයින් හා වෙළඳ සමාගම්, ව්‍යාපාරයේ යම් වෙනසක් වූ විට කාර්ය පටිපාටිය, ලියාපදිංචි කිරීමේදී කරන වැරදි සහ දණ්ඩන, ව්‍යාපාර නාමයන් ඉවත්කිරීමේ විධිවිධාන යනාදිය සම්බන්ධ ක්‍රමවේදයක් සකස්කර නොතිබීම හේතුවෙන් ඇල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මෙම ප්‍රඥප්තියට පටහැනිව කටයුතු කරන වෙළඳ ව්‍යාපාර හිමියන් හඳුනාගෙන අදාල කටයුතු කිරීමට නොහැකි වී තිබුණි. | අදාල ප්‍රඥප්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නැත |

2. ආදායම් කළමනාකරණය
---------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ----------- | -------------------- |
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයෙන් පළාත් සභා වලට පැවරී ඇති ආදායම් විෂයයන් 13 ක් සම්බන්ධයෙන් ඌව පළාත් සභාවේ ප්‍රඥප්ති සම්මත කරගෙන නොතිබුණි. | පළාත් සභාවලට පැවරී ඇති ආදායම් විෂයයන් සම්බන්ධයෙන් ප්‍රඥප්ති සම්මතකර ගතයුතුවේ. | ප්‍රඥප්ති සම්මත කර ගැනීමට අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු දැනුවත් කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2018 වර්ෂය සඳහා වූ වාර්ෂික ආදායම් ඇස්තමේන්තුවට ඇතුළත් කර තිබුණු ආදායම් විෂයයන් 18 ක ඇස්තමේන්තු ගත ආදායම දක්වා නොතිබුණි. | වාර්ෂික ඇස්තමේන්තුවට ඇතුලත් ආදායම් විෂයයන්ට අදාල ඇස්තමේන්තු ගත ආදායම දැක්විය යුතුවේ. | ප්‍රමිත කරන ලද ආදායම් විෂයය අංක ඇස්තමේන්තුවට ඇතුළත් කළ යුතුවීම. |
| (ඇ) | 1990 අංක 08 දරන ඌව පළාතේ මුදල් ප්‍රඥප්තියේ 37 වගන්තිය ප්‍රකාරව ඌව පළාතේ පිහිටි නිශ්චල දේපල පැවරීමකට අදාල සාධනපත්‍ර සඳහා අයකරනු ලබන මුද්දර ගාස්තු සඳහා පළාත් ආදායම් කොමසාරිස් විසින් තක්සේරු කර අතිරේක මුද්දර ගාස්තු අය කිරීමේදී යලි තක්සේරු සඳහා සුදුසුකම්ලත් වෘත්තීමය තක්සේරුකරුවකුගේ වාර්තා ලබාගෙන නොතිබුණි. | පළාත් මුදල් ප්‍රඥප්තියේ 37 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | පළාත් ආදායම් තක්සේරු හා බදු නිලධාරීන් පුහුණු කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඈ) | 1990 අංක 08 දරන ඌව පළාතේ මුදල් ප්‍රඥප්තියේ 104(අ) වගන්තිය ප්‍රකාරව පළාත් ආදායම් දිරිගැන්වීමේ අරමුදලක් පිහිටුවීමෙන් තොරව පළාත් ආදායම් කොමසාරිස් දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ට 2010, 2011, 2015, 2016 සහ 2017 වර්ෂ වලදී රු. 14,214,552 ක දිරි දීමනා ගෙවා තිබුණි. | පළාත් මුදල් ප්‍රඥප්තියේ 104 (අ) වගන්තිය ප්‍රකාරව පළාත් ආදායම් දිරිගැන්වීමේ අරමුදලක් පිහිටුවිය යුතුවේ. | ඉදිරියේදී ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කෙරේ. |
| (ඉ) | ඌව පළාත් කළමනාකරණ සංවර්ධන ආයතනයේ 2010-2016 කාලපරිච්ඡේදය තුළ පවත්වන ලද පුහුණු වැඩසටහන් වෙනුවෙන් අයවිය යුතු රු. 147,148 ක් 2018 දෙසැම්බර් 31 දින වන විටද අයකරගෙන නොතිබුණි. | අයවිය යුතු හිඟ මුදල් අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | 2019 අප්‍රේල් 30 දිනට ශේෂය වූ රු. 97,126 ක් ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරමි. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආදායම් විෂයයන් 05 ක සමුච්චිත හිඟ ආදායම රු. 147,876,075 ක් විය. | හිඟ ආදායම් අයකරගත යුතුවේ. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කරමින් පවතී. |

3. මූල්‍ය සමාලෝචනය

---------------------

3.1 මූල්‍ය ප්‍රතිඵලය

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පළාත් සභා අරමුදලේ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 3,300,892,380 ක ඌනතාවයක් වූ අතර , ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 207,181,480 ක් විය.

3.2 ආදායම හා වියදම

--------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයේ ආදායම හා වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| | 2018 | | | 2017 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **ආදායම්** | | | | | | |
| බදු ආදායම | 3,711,650,000 | 3,137,004,798 | (574,645,202) | 3,068,195,000 | 2,925,591,682 | (142,603,318) |
| බදු නොවන ආදායම | 608,350,000 | 570,836,175 | (37,513,825) | 371,805,000 | 561,658,971 | 189,853,971 |
| රජයේ ප්‍රදාන | 19,566,798,000 | 19,053,001,000 | (513,797,000) | 18,820,751,000 | 19,456,886,980 | 636,135,980 |
| එකතුව | 23,886,798,000 | 22,760,841,973 | (1,125,956,027) | 22,260,751,000 | 22,944,137,633 | 683,386,633 |

| | 2018 | | | 2017 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| **වියදම්** | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 490,691,000 | 399,828,138 | 90,862,862 | 15,196,717,000 | 16,505,876,088 | (1,309,159,088) |
| අනෙකුත් පුනරාවර්තන | 19,540,710,000 | 19,907,077,670 | (366,367,670) | 4,141,994,000 | 3,563,043,189 | 578,950,811 |
| උප එකතුව | 20,031,401,000 | 20,306,905,808 | (275,504,808) | 19,338,711,000 | 20,068,919,277 | (730,208,277) |
| ප්‍රාග්ධන වියදම් | 3,855,379,000 | 2,937,300,565 | 918,078,435 | 2,993,750,000 | 3,390,850,109 | (397,100,109) |
| එකතුව | 23,886,780,000 | 23,244,206,373 | 642,573,627 | 22,332,461,000 | 23,459,769,386 | 1,127,308,386 |

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වර්ෂයේ මුළු ආදායම රු. 22,760,841,973 ක් වූ අතර ඉන් රු. 19,053,001,000 ක් රජයේ **ප්‍රදාන** විය. බදු ආදායම රු. 3,137,004,798 ක් හෙවත් මුළු ආදායමෙන් සියයට 14 ක්ද බදු නොවන ආදායම රු. 570,836,175 ක් හෙවත් මුළු ආදායමෙන් සියයට 2 ක්ද වී තිබුණි. වර්ෂයේ මුළු ආදායම වූ රු. 22,760,841,973 න් පුනරාවර්තන වියදම් සඳහා රු. 20,306,905,808 ක් හෙවත් සියයට | පළාත් සභාවට පැවරී ඇති ආදායම් විෂයයන් වලින් ප්‍රමාණවත් ආදායමක් රැස්කර ගැනීම සුදුසු වේ. | අදහස් දක්වා නැත. |

89 ක්ද ප්‍රාග්ධන වියදම් සඳහා රු. 2,937,300,565 ක් හෙවත් සියයට 13 ක්ද උපයෝජනය කර තිබුණි. 13 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව පළාත් සභා වලට පැවරී ඇති ආදායම් විෂයයන් වලින් ප්‍රමාණවත් ආදායමක් රැස්කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 රජයේ ප්‍රදාන

පළාත් සභා සංවර්ධන වැඩ යෝජනා සඳහා ලැබී තිබුණු ප්‍රතිපාදන සහ ඒවා උපයෝජනය කිරීම පිළිබඳ විස්තර පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|---|
| අරමුදල් ප්‍රභවය | අනුමත මුදල | වැයකළ මුදල | ඌණ උපයෝජනය | | |
| | රු. | රු. | රු. | | |
| උපමාන පාදක ප්‍රදාන | 559,600,000 | 400,200,000 | 159,400,000 | ප්‍රතිපාදන උපරිම වශයෙන් උපයෝජනය කළ යුතුවේ. | අදහස් දක්වා නැත. |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන | 3,172,997,000 | 1,982,600,000 | 1,190,397,000 | | |
| ලෝක බැංකු ආධාර | 546,800,000 | 401,800,000 | 145,000,000 | | |
| එකතුව | 4,279,397,000 | 2,784,600,000 | 1,494,797,000 | | |

4.1.2 පළාත් සංවර්ධන සැලැස්ම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය සඳහා වූ පළාත් සංවර්ධන සැලැස්ම යටතේ නව වැඩ හා අවිච්ඡේද වැඩ වෙනුවෙන් රු. මිලියන 3,794.72 ක ඇස්තමේන්තු අගයකට වූ ව්‍යාපෘති යෝජනා 3,481 ක් අනුමත කර තිබුණි. පළාත් සභාවේ ප්‍රගති වාර්තා අනුව ව්‍යාපෘති වැඩ යෝජනාවල ප්‍රගතිය පහත දැක්වේ. | | |

| ව්‍යාපෘති විස්තර | නව වැඩ | අවිච්ඡේද වැඩ | මුළු වැඩ යෝජනා | | |
|---|---|---|---|---|---|
| සම්පූර්ණයෙන් නිමකළ | 2838 | 206 | 3044 | ගිවිසුම් වලට එළඹි ව්‍යාපෘති යෝජනා නිමකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නැත. |
| සියයට 50 ට වඩා වැඩියෙන් නිමකළ | 229 | 18 | 247 | | |
| සියයට 50 ට වඩා අඩුවෙන් නිමකළ | 61 | 3 | 64 | | |
| ආරම්භකර නොතිබූ | 87 | 1 | 88 | | |
| මතභේදකාරී/ප්‍රශ්නකාරී තත්ත්වයන් යටතේ වූ | 38 | - | 38 | | |
| එකතුව | 3253 | 228 | 3481 | | |

4.1.3 තිරසර සංවර්ධන අරමුණු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පස්සර කලාප අධ්‍යාපන කාර්යාලය විසින් තිරසර සංවර්ධන අරමුණුවල ඇතුළත් ඉලක්ක ඉටුකරගත හැකි පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර නොතිබුණු අතර වැලිමඩ කලාප අධ්‍යාපන කාර්යාලය විසින් සැලැස්මේ ඇතුළත් කාර්යයන් 06 ක් ඉටුකර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු ඉටුකර ගතහැකි වන පරිදි වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර එහි ඇතුළත් අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | වර්ෂය පුරා වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ. |

4.1.4 පාසල් කාර්ය සාධනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පස්සර අධ්‍යාපන කලාපයට අයත් පාසල් වලින් සියයට 50 කට වැඩි පාසල් සංඛ්‍යාවක සිසුන් 2014-2018 දක්වා වර්ෂවලදී ශිෂ්‍යත්ව විභාගය අසමත් වී තිබුණි. සියයට 50 කට ආසන්න පාසල් සංඛ්‍යාවක අ.පො.ස(සා.පෙළ) විභාගයට 2013-2017 දක්වා වර්ෂවල පෙනී සිටි සිසුන්ගෙන් සමත් ප්‍රතිශතය සියයට 50 ට අඩු විය. | සිසුන්ගේ අධ්‍යාපන තත්ත්වය වැඩිදියුණු කළ යුතුවේ. | අධ්‍යාපන ප්‍රතිඵල ඉහල නැංවීමට අවශ්‍ය නව වැඩපිළිවෙලවල් ක්‍රියාත්මක කෙරේ. |
| (ආ) | පස්සර අධ්‍යාපන කලාපයේ විශේෂ අධ්‍යාපන අවශ්‍යතා පවතින සිසුන් 07 දෙනෙකු විශේෂ අධ්‍යාපන ඒකක වෙත යොමුකර නොතිබුණු අතර, නොවිධිමත් අධ්‍යාපන පාඨමාලා 11 ක් පැවැත්වීමට සැලසුම්කර තිබුණ ද පාඨමාලා 02 ක් පමණක් පවත්වා තිබුණි. | විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන්ගේ අධ්‍යාපන තත්ත්වය වැඩිදියුණුවන පරිදි | ප්‍රතිපාදන නොලැබීම. |

| | | | |
|---|---|---|---|
| | | පාඨමාලා සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුවේ. | |
| (ඇ) | පස්සර අධ්‍යාපන කලාපය තුළ ශිෂ්‍ය සංඛ්‍යාව 50 ට අඩු, වැසීයාමේ අවදානමකට ලක්විය හැකි පාසල් 23 ක් පැවතුනි. | පාසල්වල ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිකර ගැනීමට ගතයුතු ක්‍රියාමාර්ග කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු විය යුතුවේ. | දුෂ්කර ප්‍රදේශවල පිහිටා තිබීම හා බොහෝ සිසු පිරිසක් නාගරික ප්‍රදේශවල පාසැල්වලට සංක්‍රමණය වීම. |
| (ඈ) | මහියංගණය අධ්‍යාපන කලාපයේ 2017 වර්ෂයේ අ.පො.ස.(සා.පෙළ) විභාගයට සිසුන් පෙනීසිටි පාසැල් 46 න් පාසල් 18 ක විභාග ප්‍රතිඵල සියයට 50 ට අඩු ප්‍රතිශතයක් වූ අතර පාසල් 02 ක ප්‍රතිඵල ශුන්‍ය වී තිබුණි. සියළුම සිසුන් ගණිතය විෂයය අසමත් වූ පාසල් 04 ක් පැවති අතර 2017 වර්ෂයේ ශිෂ්‍යත්ව විභාගය පැවැත් වූ පාසල් 71 ක් අතරින් සිසුන්ගේ කඩඉම් ලකුණු නොඉක්ම වූ පාසල් 36 ක් පැවතුනි. 2015-2017 දක්වා වර්ෂවල අ.පො.ස.(උ.පෙළ) විභාගයේ ප්‍රතිඵල අනුව විද්‍යා හා ගණිතය විෂයය ධාරාවන්හි සමත් ප්‍රතිශතයන් පිළිවෙලින් සියයට 24-31 ක් හා සියයට 24-38 දක්වා පහල මට්ටමක පැවතුනි. | සිසුන්ගේ අධ්‍යාපන තත්ත්වය වැඩි දියුණු කළ යුතුවේ. | ශිෂ්‍යත්ව ප්‍රතිඵල ක්‍රමිකව වර්ධනය වී ඇති අතර අ.පො.ස. (සා.පෙළ) හා අ.පො.ස. (උ.පෙළ) විභාග ප්‍රතිඵල ඉහල නැංවීමට අවශ්‍ය වැඩසටහන් ඉදිරියේදී ක්‍රියාත්මක කෙරේ. |
| (ඉ) | මහියංගණය අධ්‍යාපන කලාපයේ විශේෂ අධ්‍යාපනය ලබාදිය යුතු ළමයින් 08 දෙනෙකු හඳුනාගෙන තිබුණ ද නව විශේෂ අධ්‍යාපන ඒකක පිහිටුවා ඔවුන් විශේෂ අධ්‍යාපන පත්වීම් සහිත ගුරුවරයකු යටතට යොමු කර නොතිබුණි. එමෙන්ම පාසල් නොයන ළමයින් 32 ක් හඳුනාගෙන තිබුණ ද ඉන් ළමයින් 12 දෙනෙක් පමණක් පාසල්වලට යොමුකර තිබුණි. | විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත සිසුන් හඳුනාගෙන ඔවුන්ගේ අධ්‍යාපන තත්ත්වය වැඩිදියුණු කිරීමට කටයුතු කළ යුතුවේ. | දරුවන්ගේ පවුල් පරිසරය තුළ පවත්නා ගැටළු හේතුවෙන් දරුවන් පාසල් වෙත යොමු කර ගැනීමට නොහැකි වී ඇත. |
| (ඊ) | වැලිමඩ අධ්‍යාපන කලාපයේ 2015-2018 දක්වා වර්ෂවල ශිෂ්‍යත්ව විභාගයට සිසුන් පෙනීසිටි පාසැල් පිළිවෙලින් 99,99,97 හා 99 කින් පිළිවෙලින් පාසැල් 59,51,37 සහ 52 කින් කිසිදු ශිෂ්‍යයකු සමත් වී නොතිබුණි. එමෙන්ම එම සිසුන් අසමත් පාසැල් එකම පාසැල් බවද නිරීක්ෂණය විය. | සිසුන්ගේ අධ්‍යාපන තත්ත්වය වැඩි දියුණු කළ යුතුවේ. | 2016 සිට 2018 වර්ෂය දක්වා පිළිවෙලින් විභාග ප්‍රතිඵල වල ක්‍රමික වර්ධනයක් සිදු වී ඇත. |
| (උ) | වැලිමඩ අධ්‍යාපන කලාපයේ 2017 සහ 2018 වර්ෂවලදී හඳුනාගත් පාසල් නොයන සහ හැර යන සිසුන් අතරින් පිළිවෙලින් සිසුන් 28 දෙනෙකු හා 12 දෙනෙකු නැවත පාසැල්වලට යොමුකර නොතිබුණි. | පාසල් නොයන සහ හැර යන සිසුන් නැවත පාසල් ගතකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | දරුවන් පාසල්ගත කිරීම පිළිබඳව කටයුතු කළද විවිධ හේතූන් මත පාසල් ගත කිරීමට නොහැකි වී ඇත. |
| (ඌ) | වැලිමඩ කලාප අධ්‍යාපන කාර්යාලය විසින් 2018 වර්ෂය සඳහා නොවිධිමත් අධ්‍යාපන පාඨමාලා 18 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණ ද පාඨමාලා 06 ක් පමණක් පවත්වා තිබුණි. | ඉලක්ක කරගත් පාඨමාලා සැලසුම් කල පරිදි | පාඨමාලා පැවැත්වීම සඳහා ප්‍රතිපාදන ලැබී |

| | | | |
|---|---|---|---|
| | | පැවැත්වීමට කටයුතු කළ යුතුවේ. | නොමැත. |
| (එ) | පස්සර හා වැලිමඩ අධ්‍යාපන කලාපවල පාසල් වාරයකට අවම වශයෙන් එක් වරක්වත් ආවරණය වන පරිදි ඇතැම් පාසල් අධීක්ෂණය කර නොතිබුණු අතර, අධීක්ෂණය කරන ලද පාසල්වල ද අධ්‍යාපන ගුණාත්මක දර්ශක ඉහළ නැංවීමට කටයුතු කර නොතිබුණි. | පාසල් අධීක්ෂණ කටයුතු විධිමත් කර එම පාසල්වල අධ්‍යාපනයේ ගුණාත්මක භාවය ඉහළ නැංවිය යුතුවේ. | ඉදිරියේදී අවශ්‍ය පියවර ගනිමි. |

4.1.5 වෙනත් නිරීක්ෂණ
--------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ----------------------- | ----------- | ------------------- |
| (අ) | ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කිරීමේදී 5 ශ්‍රේණිය ශිෂ්‍යාධාර ලබන සිසුන් සංඛ්‍යාව පිළිබඳ සැලකිලිමත් නොවී ශිෂ්‍යාධාර වියදම් ඇස්තමේන්තු කිරීම නිසා 2017 වර්ෂය සඳහා රු. 7,340,000 ක සහ 2018 වර්ෂය සඳහා රු. 350,000 ක ඌන ඇස්තමේන්තු සකස් කර තිබුණි. එමෙන්ම ඌව පළාතේ කලාප අධ්‍යාපන කාර්යාල 04 කට අදාලව 2017 වර්ෂය සඳහා රු. 3,311,500 ක සහ කලාප අධ්‍යාපන කාර්යාල 09 කට අදාලව 2018 වර්ෂය සඳහා රු. 7,343,500 ක් ශිෂ්‍යාධාර ගෙවා නොතිබුණි. | ශිෂ්‍යාධාර ලබාදීම සම්බන්ධයෙන් තාත්වික හා නිවැරදි ඇස්තමේන්තු සකස් කර එම මුදල් ශිෂ්‍යයන් වෙත ලබාදීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ශිෂ්‍යාධාර හිමිවන ශිෂ්‍ය සංඛ්‍යාව නිශ්චිතව ඇස්තමේන්තු කිරීම අපහසු වේ. |
| (ආ) | 2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛය අනුව උපමානපාදක මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය කර පළාත් සභා මන්ත්‍රීවරුන් විසින් යෝජනා කරන සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පහත සඳහන් පරිදි ඒ ඒ උපමාන යටතේ වියදම් කළ හැකි වැය සීමාවන් නොසලකා කටයුතු කර තිබුණි. | 2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2019 සිට 2023 මධ්‍යකාලීන සැලැස්ම තුළ සියළුම ගැටළු හඳුනාගෙන ප්‍රමුඛතා වැඩ පිළිවෙලක් මගින් එම ගැටළු නිරාකරණය කිරීමට සැලසුම් කර ඇත. |

| නිර්නායකය | චක්‍රලේඛයේ දැක්වෙන ප්‍රතිශතය | වියදම් කළහැකි මුදල | වැයකළ ප්‍රතිශතය | වැයකළ මුදල | වියදම් නොකල/ සීමාව ඉක්මවා වියදම් කර තිබුණු මුදල |
|---|---|---|---|---|---|
| | | රු. | | රු. | රු. |
| ආර්ථික යටිතල පහසුකම් | 30 | 51,000,000 | 23 | 39,466,576 | 11,533,424 |
| සමාජ යටිතල පහසුකම් | 30 | 51,000,000 | 46 | 77,931,920 | (26,931,920) |
| ස් වයං රැකියා ප්‍රවර්ධනය | 20 | 34,000,000 | 11 | 18,259,182 | 15,740,818 |
| වාරිමාර්ග හා කෘෂිකර්මය | 10 | 17,000,000 | 01 | 2,502,649 | 14,497,351 |
| ආගමික සංස්කෘතික හා කලා කටයුතු | 10 | 17,000,000 | 19 | 31,839,672 | (14,839,672) |

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඌව පළාත් කළමනාකරණ සංවර්ධන ආයතනයේ ඕහිය සහ පැල්ගහතැන්න පුහුණු මධ්‍යස්ථානවලට අයත් ඉඩම්වල නීත්‍යානුකූල අයිතිය ඌව පළාත් සභාවට පවරා ගෙන නොතිබුණි. | ආයතනවල ඉඩම් නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදී කටයුතු කිරීමට අපේක්ෂා කෙරේ. |
| (ආ) | මො/බිබිල යශෝධරා බාලිකා විද්‍යාලය සඳහා අක්කර 05 රූඩ් 02 පර්චස් 22 ක ඉඩම් කොටසක් පෞද්ගලික පාර්ශවයකින් 2007 පෙබරවාරි 02 දින රු. 4,800,000 කට මිලදීගෙන තිබුණු නමුත් ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ලියාපදිංචි කර තිබුණේ 2015 පෙබරවාරි 23 දිනදීය. තවද ඉඩමේ භුක්ති අයිතිය 2018 දෙසැම්බර් 31 දින වන විටද සනාථ කරගෙන නොතිබූ අතර මොනරාගල දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරිගේ 2012 අගෝස්තු 22 දිනැති මැණුම් වාර්තාව අනුව එම ඉඩමෙන් හෙක්ටයාර් 0.3768 ක් පාර්ශවයන් 04 ක් විසින් අනවසරයෙන් අත්කරගෙන ඇති බව සනාථකර තිබුණි. | ඌව පළාත් සභාවට අයත් පාසල් ඉඩම්වල භුක්තිය තහවුරු කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | භුක්තිය තහවුරු කර ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ඇ) | ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම් හා ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් 2018 වර්ෂය සඳහා ක්‍රියාත්මක කරන ලද තුලිත සංවර්ධන වැඩසටහන, විශේෂ ග්‍රාමීය සංචාර හා ඉතා දිළිඳු පවුල් නගාසිටුවීම, විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන සංවර්ධන වැඩසටහන සහ ඌන සංවර්ධිත ගම්මාන සංවර්ධන වැඩසටහන යන ප්‍රාග්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ව්‍යාපෘති හඳුනාගැනීම සඳහා විධිමත් ක්‍රියාපටිපාටියක් ස්ථාපිත කර නොතිබුණි. | ප්‍රාග්ධන ව්‍යාපෘති හඳුනාගැනීම සඳහා විධිමත් ක්‍රියා පටිපාටියක් ස්ථාපනය කළ යුතුවේ. | ඉදිරියේදී ස්ථාපනය කිරීමට කටයුතු කෙරේ. |
| (ඈ) | මුදල් කොමිෂන් සභාවේ ලේකම්ගේ 2018 ජනවාරි 16 දිනැති අංක **PC/3/2/2018-II** දරන ලිපිය අනුව විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමේදී විශේෂ අවශ්‍යතා සහිත ගම්මාන හඳුනාගැනීම සඳහා සුදුසු නිර්නායක ස්ථාපිත කර ඒ අනුව ප්‍රමුඛත්වයන් දියයුතු ව්‍යාපෘති හඳුනාගෙන ක්‍රියාත්මක කලයුතු වුවද, ඌව පළාත් ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, අධ්‍යාපන, පළාත් පාලන, | ප්‍රමුඛත්වය දිය යුතු ව්‍යාපෘති හඳුනාගෙන ඒවා ක්‍රියාත්මක කිරීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ. | උපරිම ප්‍රයත්නයන් දරා ඇති අතර, ඉදිරියේදී තවදුරටත් නිවැරදි කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | ඉඩම්, විදුලිබල හා බලශක්ති, ඉදිකිරීම් හා ග්‍රාමීය යටිතල පහසුකම් අමාත්‍යාංශය විසින් එසේකර නොතිබුණි. එමෙන්ම ව්‍යාපෘති සැලසුම් කිරීමේදී සහභාගිත්ව ප්‍රවේශයක් තුලින් සංවර්ධන ප්‍රමුඛතා හඳුනාගෙන ද නොතිබුණි. | | |
| (ඉ) | 2001 අංක 01 දරන ඌව පළාත් මගී ප්‍රවාහන සේවා අධිකාරිය පිළිබඳ ප්‍රඥප්තිය ප්‍රකාරව ඌව පළාත ඇතුළත මගී ප්‍රවාහන සේවාවන්ද, ඌව පළාතට අදාල වන ප්‍රමාණයට ඌව පළාත හා සම්බන්ධ වන අන්තර් පළාත් මගී ප්‍රවාහන සේවාවන්ද විධිමත් කිරීම හා එම කාර්යයට අනුශංගික වන අනෙකුත් කාර්යයන් විධිමත් කිරීම උදෙසා ඌව පළාත් සභාවේ මගී ප්‍රවාහන සේවා අධිකාරී ප්‍රඥප්තිය සඳහා වූ රෙගුලාසි 2018 පෙබරවාරි 28 දින වන විටත් සකස් කිරීමට කටයුතු කර නොතිබුණි. | රෙගුලාසි අනුමත කර ගැනීම තුළින් සේවාවන් විධිමත් කළ යුතුවේ. | නීති අංශයට යොමු කර ඇතත් මෙතෙක් අනුමත වී නොමැත. |
| (ඊ) | ක්‍රීඩා හා යෞවන කටයුතු, සංචාරක, ප්‍රවාහන, සංස්කෘතික සහ ජේෂකර්ම හා කුඩා කර්මාන්ත අමාත්‍යාංශය 2017 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ ඇල්ල නගරයේ උමගෙහි ඉහල කොටසේ භූමිය සකසා මල් පැළ සිටුවා අලංකරණ කටයුතු සිදුකිරීම වෙනුවෙන් රු.700,200 ක් වැය කර තිබුණි. එහෙත්, නිසි නඩත්තුවක් නොමැතිවීම හේතුවෙන් සිටුවා තිබුණු මල් පැළ විශාල ප්‍රමාණයක් විනාශ වී තිබුණු බව 2018 නොවැම්බර් 13 දින සිදුකළ විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය. | වත්කම් ආරක්ෂාකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | උෂ්ණාධික කාලගුණය හේතුවෙන් හා ඇතැම් පුද්ගලයින් පැල ගලවාගෙන ගොස් ඇති බැවින් මල්පැල විනාශ වී ඇත. |
| (උ) | 2017 දෙසැම්බර් 24 දින බොරලන්ද සත්ත්ව ගොවිපලට ලබාදී තිබූ වටිනාකම රු.48,000,000 ක් වූ ආනයනික ගර්භණී එළ ගවයින් 100 දෙනෙකුගෙන් වටිනාකම රු.3,840,000 ක් වූ ගවයින් 08 දෙනෙකු මියගොස් තිබුණි. සෞඛ්‍යාරක්ෂිත ලෙස රඳවා තැබීමට සුදුසු ගවගාලක් ගොවිපලෙහි නොමැතිවීම සතුන් මියයාමට හේතු වී තිබුණි. | සෞඛ්‍යාරක්ෂිතව සතුන් රැඳවීමට ගවගාලක් ඉදිකළ යුතුවේ. | කොන්ත්‍රාත්කරු විසින් නියමිත දිනට ගවගාලේ වැඩ අවසන් කර භාරදී නොමැත. |
| (ඌ) | 2018 නොවැම්බර් 31 දින වන විට ආනයනික ගවදෙනුන් බිහිකල පැටවුන් 89 කගෙන් 45 ක් මිය ගොස් තිබුණි. සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයකට පැටවුන් රැකබලා නොගැනීම නිසා රෝගීවීම හේතුවෙන් මෙසේ මියගොස් ඇති බව අනාවරණය වී තිබුණි. | සෞඛ්‍යාරක්ෂිත ක්‍රමවේදයකට සතුන් රැකබලා ගත යුතුවේ. | කොන්ත්‍රාත්කරු විසින් නියමිත දිනට පැටවු කොටු ඉදිකර භාරදී නොමැත. |

4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | බණ්ඩාරවෙල දිසා රෝහලේ මනෝ වෛද්‍ය අංශය මගින් මානසික රෝගීන්ගේ මානසික සංවර්ධන කටයුතු වෙනුවෙන් සුවදිවි වැඩසටහනක් ක්‍රියාත්මක කර රෝගීන් අසූවකට ආසන්න ප්‍රමාණයකට සේවය ලබාදෙමින් පැවතියද ඒ සඳහා අවශ්‍ය ගොඩනැගිලි, උපකරණ සහ අනෙකුත් භෞතික පහසුකම් ප්‍රමාණවත් පරිදි සපයා නොතිබුණි. | භෞතික පහසුකම් ලබාගැනීමට අවශ්‍ය කටයුතු කළ යුතුවේ. | ප්‍රතිපාදන සීමා සහිතව ලැබෙන බැවින් සියළුම අවශ්‍යතා එකවර සම්පූර්ණ කිරීම අපහසුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2015,2016 සහ 2017 වර්ෂවලදී පළාත් සභා මන්ත්‍රීවරුන් විසින් ග්‍රාම නිලධාරි වසම් 33 ක් සඳහා යෝජනා කර තිබුණු කිසිදු උපමාන පාදක සංවර්ධන යෝජනාවක් ක්‍රියාත්මක කර නොතිබුණු අතර, පළාත් සභාවෙන් කැඳවනු ලබන උපමාන පාදක ව්‍යාපෘති යෝජනා පිළිබඳව ප්‍රාදේශීයව මහජනතාවට සන්නිවේදනය කිරීමේ ක්‍රමවේදයක් ද සකස් කර නොතිබුණි. සම්පත් පැතිකඩ දත්ත පද්ධතිය අනුව රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කඳුබැද්ද ග්‍රාම නිලධාරි වසම තුල සනීපාරක්ෂක පහසුකම් අවම මට්ටමක පැවති අතර, පවුල් 178 ක් පානීය ජලය අනාරක්ෂිත ළිං වලින් ලබාගනිමින් පැවතුනි. තවද වැසිකිලි පහසුකම් නොමැති පවුල් ගණන 96 ක් හා වල වැසිකිලි භාවිතා කරන පවුල් ගණන 63 ක් වූ අතර කටුමැටි බිත්ති සහිත නිවාස 101 ක් පැවතුනි. | අදාල චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | ප්‍රතිපාදන වෙන්කර ගෙන ඉදිරි වර්ෂයේදී ක්‍රියාත්මක කරන අතර, ඉදිරියේදී සුදුසුම ප්‍රතිලාභීන් විධිමත්ව හඳුනාගැනීමේ වැඩසටහනක් සැලසුම් කෙරේ. |
| (ඇ) | හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වැඩිම සේවා වියුක්තියක් පවතින බෝගහමඩිත්ත ග්‍රාම නිලධාරි වසම සඳහා 2016 සහ 2017 වර්ෂ දෙක තුලදී කිසිදු ස්වයං රැකියා ආධාරයක් ලබාදී නොතිබුණි. 2015 දෙසැම්බර් 30 දිනැති අංක 2016/01 දරන මුදල් කොමිෂන් සභා චක්‍රලේඛය අනුව ආගමික සංස්කෘතික හා කලා කටයුතු සංරවකය යටතේ ඌව පළාතේ අභාවයට යමින් පවතින සාම්ප්‍රදායික සංස්කෘතික කටයුතු පාරම්පරික නැටුම් සහ කලා කටයුතු හඳුනාගෙන ප්‍රවර්ධනය හා සංරක්ෂණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණි. | අදාල චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | උපමාන පාදක වැඩසටහන සඳහා තොරතුරු සංස්කෘතික අමාත්‍යාංශයෙන් ලබාගෙන එම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. |

4.4 වත්කම් කළමනාකරණය
---------------------------

4.4.1 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්
---------------------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ----------- | -------------------- |
| (අ) | ඌව පළාත් කළමනාකරණ සංවර්ධන ආයතනයේ භාවිතයෙන් ඉවත්කර ඇති කාලය නිශ්චිතව හඳුනාගත නොහැකි උපකරණ ඒකක 10 ක් සහ භාවිතයට නොගන්නා උපකරණ ඒකක 03 ක් නිෂ්ක්‍රීයව පැවතුණි. | පළාත් සභාව සතු සම්පත් උපරිම ධාරිතාවයෙන් උපයෝජනය විය යුතුවේ. | අදාල වත්කම් සම්බන්ධයෙන් කටයුතු කළයුතු ආකාරය සම්බන්ධයෙන් කමිටුවක් පත්කර නිර්දේශ ලබාගෙන ඇති අතර ඒ අනුව අදාල භාණ්ඩ වෙන්දේසි කිරීමට තක්සේරු කමිටුවක් පත්කර ඇත. |
| (ආ) | ඌව පළාත් කළමනාකරණ සංවර්ධන ආයතනයට අයත් ඕහිය පුහුණු මධ්‍යස්ථානයේ පුහුණුලාභීන්ට සහ දේශීය හා විදේශීය සංචාරකයන්ට නවාතැන් පහසුකම් ලබාදීම සඳහා කාමර 10 ක් පැවතියද උපයෝජනයට ගෙන නොතිබුණු කාමර දින ගණන 2017 හා 2018 වර්ෂවල පිළිවෙලින් 2920 ක් හා 1900 ක් විය. ඒ අනුව ආයතනයේ දේශනශාලා හා නේවාසිකාගාර උපරිම ධාරිතාවයෙන් ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | පළාත් සභාව සතු සම්පත් උපරිම ධාරිතාවයෙන් භාවිතා කිරීමට කළමනාකරණය විසින් කටයුතු කළ යුතුවේ. | විගණනය විසින් පෙන්වා දී ඇති තත්ත්වයන් මඟ හරවා ගැනීමට ආයතනය විසින් පුළුල් ප්‍රචාරණයක් ලබාදී වඩාත් ආකර්ෂණීය ස්ථානයක් බවට |

| | | | |
|---|---|---|---|
| | | | පත්කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් පවතී. |
| (ඇ) | බණ්ඩාරවෙල දිසා රෝහලට 2017 ඔක්තෝබර් 20 දින පරිත්‍යාගයක් ලෙසට ලැබී තිබුණු එකෝ පරීක්ෂණ යන්ත්‍රය වෛද්‍යවරයෙකු සහ අනෙකුත් පහසුකම් නොමැති වීම හේතුවෙන් නිෂ්කාර්යව පැවතුණි. | පළාත් සභාව සතු වත්කම් වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුවේ. | රෝහලට මෙම යන්ත්‍රයෙන් ප්‍රයෝජනයක් නොමැති බැවින් අවශ්‍යතාවයක් ඇති රෝහලක් වෙත ලබාදීමට කටයුතු කෙරේ. |
| (ඈ) | 2016 වර්ෂයේදී රු.264,548 ක් වැයකර වැඩ නිමකර තිබුණු බණ්ඩාරවෙල දිසා රෝහලේ ජීව වායු ඒකකය 2018 ඔක්තෝබර් 11 දින වන විටද ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | පළාත් සභාව සතු වත්කම්වලින් ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුවේ. | කොන්ත්‍රාත්කරු දැනුවත් කළ ද අවශ්‍ය කටයුතු සිදුකර නොමැති බැවින් ඔහු අසාදු ලේඛනගත කිරීමට කටයුතු කෙරේ. |
| (ඉ) | බණ්ඩාරවෙල දිසා රෝහලේ පානීය ජල අවශ්‍යතාවය වෙනුවෙන් රෝහල් භූමියේ පිහිටි ජල කඳුරෙන් ලබාගන්නා ජලය පිරිසිදු කිරීම සඳහා වටිනාකම රු.43,991 ක් වූ උපකරණයක් 2018 ජනවාරි 20 දින ස්ථාපනය කර තිබුණු අතර, එම උපකරණය 2018 මැයි මස සිට අක්‍රියවී තිබුණි. මෙම උපකරණය සඳහා වසරක වගකීම් කාලයක් ලබාදී තිබුණද 2018 ඔක්තෝබර් 11 දින වන විටද යථා තත්ත්වයට පත්කර නොතිබුණි. | පළාත් සභාව සතු වත්කම් නිසි ලෙස නඩත්තු කර ප්‍රයෝජන ගැනීමට කටයුතු කළ යුතුවේ. | මිලදීගත් ආයතනයෙන් යන්ත්‍රය අළුත්වැඩියා කිරීමට ඇස්තමේන්තුවක් ලබාගෙන අවශ්‍ය කටයුතු සිදු කෙරේ. |
| (ඊ) | බණ්ඩාරවෙල දිසා රෝහලේ අක්ෂි සායන වෛද්‍යවරයෙකු නොමැතිවීම හේතුවෙන් 2015 වර්ෂයේ සිට අක්ෂි සායන පවත්වා නොතිබුණි. මේ හේතුවෙන් සායන කටයුතු සඳහා භාවිතා කරන ලද උපකරණ නිෂ්කාර්යව පැවතුණි. | අවශ්‍ය මානව සම්පත් සපයාගෙන ලබාදී ඇති භෞතික සම්පත් ප්‍රයෝජනයට ගෙන මහජනතාවට සේවය සැපයීමට කටයුතු කළ යුතුවේ. | අවශ්‍ය මානව සම්පත් බදුල්ල මහා රෝහලෙන් සපයාගෙන සායන කටයුතු පවත්වාගෙන යාමට කටයුතු කෙරේ. |
| (උ) | ස්ප්‍රිංවැලි ප්‍රාදේශීය රෝහලෙහි 2017 ඔක්තෝබර් 06 දින රෝහලේ සවිකරනලද ඇඟිලි සලකුණු යන්ත්‍රය අදාල කාර්යය සඳහා භාවිතා කර නොතිබුණි. | අදාල චක්‍රලේඛයට අනුකූලව කටයුතු කළ යුතුවේ. | වෘත්තීය සමිතිවල විරෝධතාවය හේතුවෙන් ඇඟිලි සලකුණු යන්ත්‍රය භාවිතා නොකෙරේ. |
| (ඌ) | පවුල් සෞඛ්‍ය සේවා නිලධාරිණියක නොමැති වීම හේතුවෙන් ස්ප්‍රිංවැලි ප්‍රාදේශීය රෝහලේ මාතෘ වාට්ටුව වසා දමා තිබුණු අතර එහි උපකරණද නිෂ්කාර්යව පැවතුණි. | අවශ්‍ය මානව සම්පත් සපයාගෙන ලබාදී ඇති භෞතික සම්පත් ප්‍රයෝජනයට ගෙන | අනුයුක්ත කර සිටින නිලධාරිණිය ප්‍රසූත නිවාඩු ලබා ඇති අතර ඉතා අඩු ප්‍රසූත සංඛ්‍යාවක් |

| | | | |
|---|---|---|---|
| | | මහජනතාවට සේවය සැපයීමට කටයුතු කළ යුතුවේ. | සිදුවන බැවින් නව නිලධාරිණියක් අනුයුක්ත නොකිරීමට තීරණයකර ඇත. |
| (එ) | ලෝක බැංකු ආධාර මත ක්‍රියාත්මක වන දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ 2017/2018 වර්ෂ වල මුල්‍ය ප්‍රතිපාදන උපයෝජනය කර බදුල්ල ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා කාර්යාලය සඳහා මිලදීගත් රු.1,079,460 ක් වටිනා විවිධ උපකරණ ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | උපකරණ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | විමසුම පිළිගනිමි. ඊට හේතු<br>1. හදිසි ඉල්ලීම් සඳහා නිකුත් කිරීමට.<br>2. බෙදාහැරීම් පිරිවැය හේතුවෙන් වෙනත් රාජකාරියක් පැමිණෙන තුරු සිටීම.<br>3. රෝහල් සඳහා ඇතැම් උපකරණ අත්‍යවශ්‍යතාවයක් නොමැතිවීම.<br>4. ඇතැම් උපකරණ ලැබී වැඩිකාලයක් ගතවී නොතිබීම. |
| (ඒ) | දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය යටතේ වැලිමඩ මූලික රෝහලට ලබාදී තිබුණු රු.120,000 ක් වටිනා Quadriceps chair උපකරණය ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | උපකරණ ප්‍රයෝජනය සඳහා යොදා ගැනීමට කටයුතු කළ යුතුවේ. | මෙම උපකරණ රෝගී සත්කාර සේවාව සඳහා ප්‍රයෝජනයට ගන්නා අතර, ක්‍රියාකාරී මට්ටමේ පවතී. |
| (ඔ) | බිබිල මූලික රෝහලේ දැඩි සත්කාර ඒකකය සඳහා 2016 වර්ෂයේදී මිලදී ගෙන ඇති රු.6,652,399 ක් වටිනා වෛද්‍ය උපකරණ වලින් රු.3,534,250 ක් වටිනා වෛද්‍ය උපකරණ රෝහලේ වෙනත් වාට්ටු වල ප්‍රයෝජනය සඳහා යොදා ගෙන තිබුණු අතර රු.3,118,149 ක් වටිනා වෛද්‍ය උපකරණ 2018 වර්ෂය අවසාන වන විටද ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | ප්‍රයෝජනයට නොගත් උපකරණ ප්‍රයෝජනයට ගත යුතුවේ. | අදහස් දක්වා නැත |
| (ඕ) | මහජන සෞඛ්‍ය සේවා වැය ශීර්ෂය යටතේ වූ මුල්‍ය ප්‍රතිපාදන උපයෝජනය කර 2016 වර්ෂයේදී දියතලාව, වැලිමඩ හා වැල්ලවාය මූලික රෝහල් සඳහා මිලදී ගෙන තිබුණු රු.12,650,000 ක් වටිනා රුධිර කාන්දුකරණ යන්ත්‍ර (Dialysis Machine) 10 ක් සහ රු.15,879,875 ක අනෙකුත් උපකරණ 2018 වර්ෂය අවසාන වන විටද ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | ප්‍රයෝජනයට නොගත් උපකරණ ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නැත |

| | | | |
|---|---|---|---|
| (ක) | ඉඩම් හෙක්ටයාර 352.56 ක් අවුරුදු 02 සිට අවුරුදු 10 ක කාලයක්, ගොඩනැගිලි 1157 ක් අවුරුදු 02 සිට අවුරුදු 10 ක කාලයක්, මෝටර් වාහන 38 ක් මාස 6 සිට අවුරුදු 30 ක කාලයක්, යන්ත්‍ර සූත්‍ර 8 ක් අවුරුදු 03 සිට අවුරුදු 14 ක කාලයක් නිෂ්ක්‍රීයව / ඌන උපයෝජිතව පැවති අතර කාලය හඳුනාගත නොහැකි ඉඩම් හෙක්ටයාර 84.24 ක්, ගොඩනැගිලි 299 ක්, මෝටර් වාහන 130 ක් යන්ත්‍ර සූත්‍ර 15668 ක් හා වෙනත් වත්කම් 485 ක් විය. | ඌන උපයෝජිත හෝ නිෂ්ක්‍රියව පැවති වත්කම් සක්‍රියව යොදා ගැනීම කෙරෙහි අවධානය යොමු කළ යුතුවේ. | එක් එක් ආයතනය විසින් හඳුනාගෙන ඇති නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම් සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග අදාල ආයතන විසින් ඉදිරියේදී ගනු ලැබේ. |
| (ග) | ලෝක බැංකු ආධාර මත ක්‍රියාත්මක වන "දෙවන සෞඛ්‍ය අංශ සංවර්ධන ව්‍යාපෘතිය - 2017" යටතේ වෙන් කර තිබුණු මුලා ප්‍රතිපාදන වලින් රු.1,995,000 ක් වැය කර ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය විසින් මිලදී ගෙන තිබුණු ඇඹිලි සළකුණු යන්ත්‍ර 35 ක් ප්‍රයෝජනයට නොගෙන නිෂ්කාර්යව පැවතුණි. | ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කිරීම කෙරෙහි කළමනාකරණය විසින් අවධානය යොමු කළ යුතු අතර, නිෂ්ක්‍රිය යන්ත්‍ර භාවිතා කිරීමට අවශ්‍ය පියවර ගත යුතුවේ. මිලදීගත් වත්කම් ක්‍රියාකාරීව ප්‍රයෝජනයට ගත යුතුවේ. | මූලික රෝහල්වල සහ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලවල පමණක් දැනට ක්‍රියාත්මක වේ. |

4.4.2 පවරා නොගත් වත්කම් පරිහරණය කිරීම
--------------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | -------------------- |
| රජයට සහ වෙනත් ආයතන වලට අයත් ඉඩම් 23 ක්, ඉඩම් හා ගොඩනැගිලි 65 ක් සහ මෝටර් වාහන 7 ක් විධිමත් පරිදි පවරා නොගෙන පරිහරණය කරමින් පැවතුණි. | පරිහරණය කරන ලද වත්කම්වල අයිතිය විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතුවේ. | පවරා නොගත් වත්කම් යටතට ඇතුළත් කර ඇති වත්කම් පවරා ගන්නා ලෙස අදාල ආයතන දැනුවත් කර ඇති අතර ඉඩම් පවරා ගැනීමේ කටයුතු වලදී යම් යම් ප්‍රමාද වීම් පවතී. |

4.5 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

4.5.1 ප්‍රමාද වූ ව්‍යාපෘති

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 වර්ෂයේ පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන යටතේ කොස්ලන්ද උඩමුල්ල ඇල සංවර්ධනය කිරීමේ කර්මාන්තයේ ඉදිකිරීම් පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂවරයා විසින් රු.1,096,808 ක වටිනාකමකට 2018 ඔක්තෝබර් 03 දින ගොවි සංවිධානයකට පවරා තිබුණි. 2019 ජනවාරි වන විටත් මෙම කර්මාන්තයේ කිසිදු සංවර්ධන කටයුත්තක් ආරම්භ කර නොතිබූ අතර 2018 දෙසැම්බර් 31 දිනට ප්‍රගති වාර්තාවේ අදාළ වැඩ කටයුතු කරගෙන යනු ලබන බව හා භෞතික ප්‍රගතිය සියයට 15 ක් බව දක්වා තිබුණි. | ප්‍රතිපාදන මුදල් යොදවා අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | මූලික කටයුතු ආරම්භ කර ඇති බැවින් ප්‍රතිශතය සියයට 15 ක් ලෙස සටහන් කර ඇති අතර ගෙවීම් කර නොමැති බැවින් ඉදිරි සැලසුම්වලට ඇතුළත් කිරීමට කටයුතු කෙරේ. |
| (ආ) | පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රතිපාදන යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් 2018 වර්ෂයේදී ඉදිකිරීමට සැලසුම් කර තිබුණු බුත්තලගස් ආර වැව ප්‍රතිසංස්කරණය කිරීමේ කර්මාන්තය රු.4,227,483 ක මුදලකට 2018 ජුලි 24 දින පෞද්ගලික ආයතනයකට පවරා තිබුණි. ගිවිසුම අනුව 2018 ඔක්තෝබර් 24 දින වැඩ අවසන් කළයුතුව තිබුණද, 2019 ජනවාරි වන විටත් මෙම කර්මාන්තයේ කිසිදු ප්‍රතිසංස්කරණ කටයුත්තක් ආරම්භ කර හෝ නොතිබුණි. | ප්‍රතිපාදන මුදල් යොදවා අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | ඉදිකිරීම් ආරම්භ කිරීම සඳහා කොන්ත්‍රාත්කරු උනන්දු නොවීම හා අක්මුදල් නොලැබීම හේතුවෙන් අත්තිකාරම් ගෙවීමට නොහැකිවීම මත කර්මාන්තය ආරම්භ නොකළ අතර, ඉදිරියේදී කොන්ත්‍රාත්කරු අසාදු ලේඛන ගත කිරීමට කටයුතු කෙරේ. |
| (ඇ) | සෞඛ්‍ය අමාත්‍යාංශයේ වතු රෝහල් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ ස්ප්‍රිංවැලි රෝහලේ ඉදිකිරීම් කාර්යයන් 06 ක් මධ්‍යම පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් රු.16,990,980 ක වටිනාකමට 2017 මාර්තු 10 දින පෞද්ගලික ඉදිරිකිරීම් ආයතනයකට පවරා තිබුණි. එහෙත් ඉන් කාර්යයන් 04 ක් අත්හැර දමා තිබුණි. ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණු කාර්යයන් 02 ක් 2017 ජුලි 08 දින වන විට නිමකළ යුතු වුවද, 2018 ඔක්තෝබර් 04 දින වන විටද නිමකර නොතිබුණි. | නිසි අධීක්ෂණයකින් යුතුව අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | කර්මාන්ත 02 ක් පමණක් මන්දගාමී ලෙස ක්‍රියාත්මක වන අතර ඉදිකිරීම් හා අධීක්ෂණ කටයුතු මධ්‍යම පළාත් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත. |

### 4.5.2 අත්හැර දැමූ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාරිමාර්ග දෙපාර්තමේන්තුව ගොවි සංවිධාන 02 ක් සමඟ ගිවිසුම්ගත වාරි ව්‍යාපෘති 02 ක ඉදිකිරීම් කටයුතු ඉටු නොකිරීම සම්බන්ධයෙන් එම ගොවි සංවිධාන වලට එරෙහිව කටයුතු කර නොතිබුණු අතර, වෙනත් ගොවි සංවිධාන වෙත එම ඉදිකිරීම් පැවරීමටද කටයුතු කර නොතිබුණි. මේ හේතුවෙන් රු.3,888,123 ක මුල්‍ය ප්‍රතිපාදන උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණු අතර එම ව්‍යාපෘති වලින් අපේක්ෂිත අරමුණු ද ඉටු කරගත නොහැකි වී තිබුණි. | ප්‍රතිපාදන මුදල් යොදවා අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීම කටයුතු කළ යුතුවේ. | ගොවි සංවිධානයේ උනන්දුව මත ඉදිකිරීම් ආරම්භ කිරීම ප්‍රමාද වූ අතර මෙම කර්මාන්ත ඉදිරි සැලසුම් වලට ඇතුළත් කිරීමට නියමිතය. |

### 4.5.3 අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ඌව පළාත් කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ජයිකා ආධාර මත ක්‍රියාත්මක කරන ලද සුළු වාරිමාර්ග පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ වැඩසටහන යටතේ මහකඩවර වැවේ ප්‍රතිසංස්කරණ කටයුතු 2004 වර්ෂයේදී රු.19,411,960 ක් වැය කර අවසන් කර තිබුණ ද 2018 ඔක්තෝබර් වන විටත් ගොවීන්ට ඉඩම් බෙදාදී නොතිබීම හේතුවෙන් එය නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. වැව් ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීමට පෙර ඒ සඳහා ජාතික පාරිසරික පනත යටතේ ප්‍රකාශිත අංක 772/22 දරන 1993 ජුනි 23 දිනැති ගැසට් පත්‍රය අනුව මධ්‍යම පරිසර අධිකාරියේ පාරිසරික අනුමැතිය ලබාගත යුතු වුවද එසේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | ජාතික පාරිසරික පනත යටතේ ප්‍රකාශිත අංක 772/22 දරන 1993 ජුනි 23 දිනැති ගැසට් පත්‍රය ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. | 2002/2004 ආරම්භකර ඇති පැරණි වැවක් හේතුවෙන් අනුමැතියක් ලබාගෙන නොමැති අතර මෙම වැවෙන් ලබාගන්නා ජලයෙන් අවිධිමත් හේන් වගාව සඳහාත් දෙමළිය වැවේ ජලය අවසන් වූ පසු |

| | | | |
|---|---|---|---|
| | | | පිරවීමටත් යොදා ගැනෙන අතර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් එම ඉඩම් නිදහස් කළ වහාම දෙපාර්තමේන්තුව විසින් අවශ්‍ය ක්‍රියා මාර්ග ගනු ලැබේ. |
| (ආ) | ඌව පළාත් කෘෂිකර්ම, වාරිමාර්ග, සත්ත්ව නිෂ්පාදන හා මිරිදිය ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශය විසින් 2017 වර්ෂයේ කෘෂි මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ රඹුක්පොත ඇල කෘෂි මාර්ගයේ සංවර්ධන කටයුතු සිදුකර රු. 1,820,952 ක නිමි වැඩ වටිනාකම මත කොන්ත්‍රාත්කරුට රු. 1,169,642 ක් ගෙවා තිබුණි. එහෙත් ඇස්තමේන්තුවේ සඳහන් පැති බැම්ම ඇලවී ගොස් නැවත ආධාරක යොදා සකස් කර තිබුණු අතර බදුල්ල ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරුවරයා ප්‍රමුඛ කමිටුව විසින් මෙම මාර්ගය වාහන ගමනාගමනයට සුදුසු පාරක් නොවන බවට නිර්දේශ කර තිබුණි. එමෙන්ම මාර්ගයේ මැද පිහිටි විදුලි කණු 03 ක් 2018 සැප්තැම්බර් 05 වන විටත් ඉවත් කර නොතිබුණි. | ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී නිසි අධීක්ෂණයකින් යුතුව කටයුතු කර අපේක්ෂිත අරමුණු කරා ළඟාවිය යුතුවේ. | අධික වර්ෂාව හේතුවෙන් පැති බැම්මට හානි සිදු වූ අතර එය ආධාරක යොදා සකස් කරන ලදී. අවසාන බිල්පත සඳහා මුදල් ගෙවා නොමැති බැවින් අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කෙරේ, විදුලි කණු ඉවත් කිරීම සඳහා විදුලි අධිකාරිවරයාට දැනුම්දී ඇත. |

4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

4.6.1 අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2018 දෙසැම්බර් 31 දිනට ඌව පළාත් සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

(අ) පළාත් සභා අමාත්‍යාංශ/දෙපාර්තමේන්තු හා කාර්යාල (පාසල් කාර්ය මණ්ඩලය හැර)

| සේවක වර්ගය | | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | **1436** | 1012 | 424 | - |
| (ii) | තෘතියික මට්ටම | **298** | 167 | 131 | - |
| (iii) | ද්විතික මට්ටම | **7912** | 6478 | 1434 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 6052 | 5028 | 1024 | - |
| (v) | වෙනත්(අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 998 | - | 998 |
| | එකතුව | 15698 | 13683 | 3013 | 998 |

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඌව පළාත් රාජ්‍ය සේවයට අයත් සංවර්ධන නිලධාරීන් 04 දෙනෙකු, කළමනාකරණ සහකාර නිලධාරියෙකු, රියදුරෙකු සහ කාර්යාල කාර්ය සහායකයෙකු පාර්ලිමේන්තු මන්ත්‍රී, ප්‍රධාන අමාත්‍ය සහ මන්ත්‍රී කාර්ය මණ්ඩලවලට අනුයුක්ත කර තිබුණි. | තනතුරට හිමි රාජකාරි සඳහා නිලධාරීන් යෙදවීම සුදුසු වේ. | අදහස් දක්වා නැත |

(ආ) පාසල් කාර්ය මණ්ඩලය

| සේවක වර්ගය | | අනුමත | තථ්‍ය | පුරප්පාඩු | අතිරික්තය |
|---|---|---|---|---|---|
| (i) | විදුහල්පතිවරුන් | 1077 | 695 | 382 | - |
| (ii) | ගුරුභවතුන් | 17026 | 16723 | 303 | - |
| (iii) | සහය කාර්ය මණ්ඩලය | 2127 | 1571 | 556 | - |
| (iv) | වෙනත්(අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 1341 | - | 1341 |
| | එකතුව | 20230 | 20330 | 1241 | 1341 |

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| විදුහල්පති පුරප්පාඩු 382 ක්, ගුරු සේවා පුරප්පාඩු 303 ක් සහ සහාය කාර්ය මණ්ඩල පුරප්පාඩු 556 ක් සම්පූර්ණ කර නොතිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළයුතු වේ. | ඉදිරි බඳවා ගැනීම් වලදී පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කරමි. |

4.6.2 අධ්‍යාපනය සම්බන්ධ කාර්ය මණ්ඩල පරිපාලනය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | පාසැල් වැටුප් ලැයිස්තුවලින් වැටුප් ලබන පස්සර අධ්‍යාපන කලාපයේ පාසල් 04 ක ගුරුභවතුන් 04 දෙනෙකු ඉගැන්වීමේ කාර්යයෙන් බැහැර වෙනත් සේවාවන්වල යොදවා තිබුණි. | ගුරුවරුන් ඉගැන්වීමේ කටයුතුවල යෙදවිය යුතුවේ. | අදහස් දක්වා නැත. |
| (ආ) | මහියංගණය අධ්‍යාපන කලාපයේ ගුරු පුරප්පාඩු 274 ක් පැවති අතර එම පුරප්පාඩු සපුරා නොගෙන වෙනත් අධ්‍යාපන කලාපවලට ගුරුවරුන් 25 ක් අනුයුක්ත කර තිබුණි. | පුරප්පාඩු සම්පූර්ණ කරගැනීමට කටයුතු කළ යුතුවේ. | ගුරුවරුන් 13 දෙනෙකු අනුයුක්ත කාලය අවසන්ව මෙම කලාපයේ සේවය කරන අතර 05 දෙනෙකු වෙනත් කලාප වලට මාරු වී ගොස් ඇත. 07 දෙනෙකු තවදුරටත් අනුයුක්තව සිටී. |
| (ඇ) | මහියංගණය කලාප අධ්‍යාපන කාර්යාලයේ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර හා නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුර සඳහා පිළිවෙලින් අධ්‍යාපන පරිපාලන සේවයේ I ශ්‍රේණියේ හා II ශ්‍රේණියේ නිලධාරීන් පත්කල යුතු වුවද, III ශ්‍රේණියේ නිලධාරීන් පත්කර තිබුණි. | අධ්‍යාපන පරිපාලන සේවා ව්‍යවස්ථාව අනුව කටයුතු කළ යුතුවේ. | ශ්‍රේණිධාරීන් මහියංගණය කලාපයේ නොමැතිවීම නිසා පත්වීම් සිදුකරන ලදී. |
| (ඈ) | වැලිමඩ අධ්‍යාපන කලාපයේ විශේෂ අධ්‍යාපන විෂයයන් සඳහා පත්වීම් ලබාදී තිබුණු ගුරුභවතුන් 05 දෙනෙකු වෙනත් විෂයයන් ඉගැන්වීම සහ කාර්යාල කටයුතු සඳහා යොදවාගෙන තිබුණි. | ගුරුවරුන් අදාල පත්වීම් ලැබූ විෂයයේ ඉගැන්වීම් කටයුතු සඳහා යොදවා ගත යුතුවේ. | වැලිමඩ කලාපයේ විශේෂ අධ්‍යාපන ඒකක පාසල් 11 ක පමණක් පවතී. එම පාසල්වල |

| | | |
|---|---|---|
| | | මෙවැනි ගුරුවරුන් අතිරික්තව පවතින නිසා වෙනත් කටයුතු වලට යොදා ගෙන ඇත. |

4.7 පළාත් පාලන ආයතන අධීක්ෂණය

4.7.1 හිඟ ආදායම්

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2018 දෙසැම්බර් 31 දිනට සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ වෙනුවෙන් ඌව පළාතේ පළාත් පාලන ආයතන වල අයකර නොගත් වරිපනම් බදු හා වෙනත් ආදායම් රු. 321,196,011 ක් විය. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නැත |
| (ආ) | 2018 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු. 143,013, 514 ක් හා මුද්දර ගාස්තු රු. 163,065,240 ක් පළාත් පාලන ආයතන වලට අයවිය යුතුව තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නැත |

4.7.2 නිකුත් කර තිබුණු අධිහාර සහතික වෙනුවෙන් අයවීමට ඇති මුදල්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඌව පළාතේ පළාත් පාලන බල මණ්ඩලවල වගකිව යුතු අයවලුන්ට පනවා තිබුණු අධිහාර වෙනුවෙන් 2018 දෙසැම්බර් 31 දිනට රු. 2,413,805 ක් අය වීමට තිබුණි. | ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව කටයුතු කළ යුතුවේ. | අදහස් දක්වා නැත |

5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඌව පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, කාර්යාල සහ ආයතනවල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | ඌව පළාත් සභා මුදල් රීති 133.2 | අදහස් දක්වා නැත |

| | |
|---|---|
| අභ්‍යන්තර විගණනය මගින් කරන ලද අනාවරණය කර ගැනීම් සම්බන්ධයෙන් ද කළමනාකරණය විසින් විධිමත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණු අතර ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් පසුවිපරම් ක්‍රියාත්මක කර නොතිබුණි. | ප්‍රකාරව කටයුතු කළ යුතුවේ. |

5.2 වාර්ෂික වාර්තා සභාගත කිරීම

--------------------------------

පසුගිය වර්ෂ 05 ක ඌව පළාත් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තා පළාත් සභාව ඉදිරියේ තැබීමේ තත්ත්වය පහත දැක්වේ.

| වර්ෂය | වාර්තාව නිකුත් කළ දිනය | වාර්තාව සභාගත කළ දිනය |
|---|---|---|
| 2013 | 2015.02.10 | 2016.04.28 |
| 2014 | 2015.09.21 | 2016.07.14 |
| 2015 | 2016.12.06 | 2017.02.20 |
| 2016 | 2017.08.21 | 2017.09.28 |
| 2017 | 2018.09.28 | 2018.10.25 |

5.3 **නොවිසඳී ඇති විගණන ජේද පිළිබඳ නිරීක්ෂණ**

--------------------------------------------------

පහත සඳහන් විගණන ජේද සම්බන්ධයෙන් 2017 මාර්තු 23 දින පැවැති රාජ්‍ය ගිණුම්කාරක සභාව විසින් ලබා දී තිබූ නියෝග ක්‍රියාත්මක කර නොතිබුණි.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | ආයතන සංග්‍රහයේ XIX පරිච්ඡේදයේ 5.3.1 වගන්තිය ප්‍රකාරව උපලේඛනගත නිවාස හිමි නිලධාරීන්ගේ මාසික වැටුපෙන් සියයට 10 ක් නිවාස කුලී ලෙස අයකළ යුතු වුවද එයට පටහැනිව 2008 අගෝස්තු 01 දින සිට ඌව පළාත් සභාවේ ලේකම්වරුන්ගෙන් හා නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරුන්ගෙන් මසකට රු.500 ක නාමික නිවාස කුලියක් අයකරමින් තිබීම. | ගිණුම්කාරක සභාවේ නියෝග පරිදි කටයුතු කිරීම. | අදහස් දක්වා නැත. |
| (ආ) | බණ්ඩාරවෙල දිසා රෝහලට අයත් ඉඩම තුළ පර්චස් 2.66 ක ප්‍රමාණයක අනවසරයෙන් නිවාස ඉදිකර ඇති බවට මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් 2013 නොවැම්බර් 25 දින වාර්තාවක් ලබාදී ඇති අතර වැලිමඩ මූලික රෝහල පිහිටි නියදගල පතන ඉඩමෙන් අක්කර 01 පර්චස් 0.8 ක අනවසර පදිංචිකරුවන් පදිංචි වී ස්ථිර ගොඩනැගිලි ඉදිකර ඇති බව අනාවරණය වී තිබුණි. අදාල රෝහල් වලට අයත් ඉඩම්වල මායිම් නිරවුල් කිරීම් සඳහා නිසි ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණු අතර අනවසර පදිංචිකරුවන් ඉඩම් වලින් ඉවත් කර | ගිණුම්කාරක සභාවේ නියෝග පරිදි කටයුතු කිරීම. | ප්‍රාදේශීය ලේකම්වරුන් සමඟ ඉදිරි කටයුතු කරමින් පවතී. |

| | | | |
|---|---|---|---|
| | 1979 අංක 07 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත යටතේ කටයුතු කර නිරවුල් භුක්තිය ලබාගැනීමට පියවර නොගැනීම. | | |
| (ඇ) | වැලිමඩ ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අලකොලගාල ග්‍රාම නිලධාරී වසමේ මීපිලිමාන පිහිටි හෙක්ටයාර 11.056 කින් යුත් බිම් කොටස වාණිජ කටයුත්තක් සඳහා වසර 30 ක කාලයකට ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව වෙත බදුදීමට 2011 මැයි 09 දින ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් අනුමත කර තිබුණි. ඉඩම බදු දීම සම්බන්ධයෙන් බදු ගිවිසුමකට එළඹීමට හෝ බදු ඔප්පුවක් පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව විසින් මෙම ඉඩමෙන් අක්කර 19 ක භූමි ප්‍රමාණයක් වසරකට රු.2,755,000 ක බදු කුලියකට 2012 නොවැම්බර් 06 දින සිට වගා කටයුතු සඳහා පෞද්ගලික පාර්ශවයකට බදු දී තිබූ අතර දිස්ත්‍රික් තක්සේරුකරුගේ 2012 ජූනි 14 දිනැති තක්සේරු වාර්තාව අනුව 2012 සිට 2016 වර්ෂය දක්වා ගුවන් විදුලි සංස්ථාවෙන් ඌව පළාත් සභාවට අයවිය යුතු රු.8,680,000 ක් වූ බදු ආදායමක් අයකර ගැනීමට කටයුතු කර නොතිබීම. | ගිණුම්කාරක සභාවේ නියෝග පරිදි කටයුතු කිරීම. | ගුවන් විදුලි සංස්ථාවේ දීර්ඝ කාලීන බදු අනුමැතිය අවලංගු කර ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ උපදෙස් පරිදි කටයුතු කරනු ලැබේ. |